Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

### වීඩියෝ කැමරා ශිල්පී සහායක (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම

**වීඩියෝ කැමරා ශිල්පී සහායක (තාවකාලික) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

**තනතුරට පැවරෙන කාර්යභාරය :-** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් වන්නා වූ කාර්යන්වලදී වීඩියෝ කිරීම, විශේෂ වැදගත් කමකින් යුතු අවස්ථා රූපගත කිරීම සඳහා සහාය වීම, සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු හා එහි නඩත්තු කටයුතු සඳහා සහාය වීම, වීඩියෝ පට ලේඛනාගාරය හා එහි නඩත්තු කටයුතු සඳහා සහාය වීම, වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව/ භාණ්ඩ මනාව පවත්වාගෙන යාමට සහාය වීම හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන වෙනත් කාර්යයන්.

**තනතුරෙහි ස්වභාවය :-** මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

01. *අවශ්‍ය සුදුසුකම් :*

I අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම.

II වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම සුදුසුකමක් ලෙස සැලකේ.

III පළපුරුද්ද : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

IV කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

V වෙනත් :
- I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- II අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ / නිවේදනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

02. *වයස් සීමාව :*
ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

03. *මාසික දීමනාව :*

| | | |
|---|---|---|
| මාසික දීමනාව :- | රු. | 14,340.00 |
| ගැලපුම් දීමනාව :- | රු. | 10,006.00 |
| ජීවන වියදම් දීමනාව :- | රු. | 7,800.00 |

04. I. *බඳවා ගැනීමේ ක්‍රමය* : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ. :

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| පළපුරුද්ද | 40 | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

05. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති හා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව වන සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම්වලට අදාළ සහතික පත්වල මුල්පිටපත් ඉදිරිපත් කළයුතු අතර අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

I. අයදුම්පත් 2017.07.07 දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "වීඩියෝ කැමරා ශිල්පී සහායක (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

I. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

II. ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට පිළිවන.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් සතුය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

*ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය*

*වීඩියෝ කැමරා ශිල්පී සහායක (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම*

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

1. මුලකුරු සමඟ නම :——————.

2. සම්පූර්ණ නම :——————.

3. ජාතික හැඳුනුම්පත් අංකය

4. ස්ථිර ලිපිනය : ..........................................................
: ..........................................................

5. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0

6. උපන් දිනය : වර්ෂය මාසය දිනය

7. දුරකථන අංකය : 1.
2.
3.

8. අධ්‍යාපන සුදුසුකම් ඃ

8.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) වර්ෂය :——————. විභාග අංකය :——————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අ.පො.ස (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) වර්ෂය :——————.

(ii) විභාග අංකය :——————.

(iii) ප්‍රතිඵල :——————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

9. I. වෘත්තීය සුදුසුකම් :

..........................................................................................................

..........................................................................................................

II. වෙනත් සුදුසුකම් :

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :

..........................................................................................................

..........................................................................................................

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

______________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :______________.